ශ්‍රියානි ජයවික්‍රම මද්දුමගේ
ආචාරිනී, මිල්පාක් සිංහල පාසල

# හෙළබසින් මුල් තැන ගත් දිරිය දියණී

පසුගිය දා ඕස්ට්‍රේලියාවේ සංචාරක, සම්පත් හා බලශක්ති අමාත්‍ය මාර්ටින් ෆර්ගසන් මහතා අතින් "කැපවීම හා විශේෂ දක්ෂතාව" වෙනුවෙන් වූ සම්මානය හිමි කරගත් ඇයට 2013 පෙබරවාරි 04 දින මෙල්බර්න්හි පැවති නිදහස් සමරු උළෙලේදී "දේවිකා රූපසිංහ අනුස්මරණ සම්මානය" හිමිකරගත්තාය. නමින් අසලා නානායක්කාර නම් වූ මෙම යුවතිය පදිංචි වී සිටින්නේ මෙල්බර්න් සිට කි.මී. 300ක පමණ දුරකින් පිහිටි Warrnambool කියන ප්‍රදේශයේ. Warrnambool හි Brauer Collage හි 11 වසරේ ඉගෙනුම ලබන ඇයගේ අනාගත බලාපොරොත්තුව නීති උපාධිය හැදෑරීම. මෙල්බර්න්වල උසස් විශ්ව විද්‍යාලයක නීති උපාධිය හදාරන්න නම් වී.සී.ඊ. විභාගයෙන් ඕස්ට්‍රේලියානු තෘතීයික පාඨමාලා සඳහා ඇතුලත් වීමේ අගය ATAR 98.0ක් වත් ලබාගත යුතු බව ඇය දැන සිටියා. මේ අතර වාරයේ ඇයට දැනගැනීමට ලැබුනා සිංහල භාෂාව විෂයයක් ලෙසට හැදෑරීමෙන් අතිරේක ලකුණු (bonus marks) ප්‍රමාණයක් ලබාගත හැකි බව. එහෙත් වී.සී.ඊ. විභාගයට සිංහල භාෂාව හදාරන්න ඇය පදිංචි ප්‍රදේශයේ හෝ ඒ අසලකවත් සිංහල පාසලක් තිබුනෙ නැහැ. අසලා මේ පිළිබඳව දැක්වූ උනන්දුව නිසාම ඇගේ මාපියන් තීරණය කලා ඇයට වික්ටෝරියානු භාෂා පාසල් සිංහල භාෂා පාසලකට ඇතුලත් කරන්නට. 2012 ජනවාරි මාසය ඉඳන් ඇය රොක්ස්බර්ග් පාක් සිංහල පාසැලේ වී.සී.ඊ.පන්තිය භාර විපුලි ගුණසේකර ගුරුතුමියගේ සිසුවියක් බවට පත්වුනේ ඒ විදියටයි.

එදා පටන් සෑම සෙනසුරාදාවකම පාන්දර 4.00ට නිවසින් පිටත් වන ඇය සිංහල ඉගෙන ගන්න රොක්ස්බර්ග් පාක් සිංහල පාසැලට පැමිණියා. සෙනසුරාදා උදේ පැය 3 ක් වෝනම්බුල් සිට මෙල්බර්න් වලටත් සවස නැවත පැය 3 ක් මෙල්බර්න් සිට වෝනම්බුල් වලටත් රිය පදවමින් අසලාගේ මෑණියන් දරුවෙකුගේ ඉගෙනීම වෙනුවෙන් මවකට කලහැකි උපරිම කැපකිරීම තම දියණිය වෙනුවෙන් කරනු ලැබුවා. මේ තරම් දුරක සිට සිංහල ඉගෙන ගන්න පැමිණි අසලා කෙදිනකවත් පන්තියට ප්‍රමාණ වී නොපැමිණි බවයි ඇගේ සිංහල ගුරුතුමිය සඳහන් කළේ.

2012 වසරේ වී.සී.ඊ. විභාගයට පෙනී සිටි අසලා ලකුණු 40 ක් (raw marks) ලබාගෙන වික්ටෝරියා ප්‍රාන්තයෙන් සිංහල භාෂාවට ඉහළම ලකුණු ලබා ගැනීමට සමත් වුනේ තම උත්සාහයත් කැපවීමේත් ප්‍රතිඵල උපරිම ලෙස අත් විඳිමිනුයි. 2012 වසරේ සිංහල භාෂා විෂයයට අතිරේක ලකුණු (bonus marks) 7ක් එකතු වන බැවින් ප්‍රමිතිකරණයෙන් (scaling) පසුව ඇයගේ ප්‍රමුත ලකුණු (scaled up marks) 47 දක්වා ඉහල යනවා. එය ඇයගේ අනාගත අපේක්ෂාව වන නීති උපාධිය හැදෑරීම සඳහා අවශ්‍ය වන ඉහල ATAR අගයක් ලබා ගැනීමට ඉමහත් රුකුලක් වෙනවා.

සිංහල භාෂාවට ඉහලම ලකුණු ලබාගත හැක්කේ ලංකාවේ ඉහල පන්ති දක්වා සිංහල ඉගෙන ගෙන ඕස්ට්‍රේලියාවට පැමිණි දරුවන්ට පමණකැයි සමහරුන් දරන ආකල්පය නිවැරදි නොවන බව ද මෙම දිරිය දියණිය අපට පෙන්වා දී තිබෙනවා. ලංකාවේ මියුසියස් විදුහලේ 06 වසර දක්වා අධ්‍යාපනය ලැබූ අසලා ඕස්ට්‍රේලියාවේ පදිංචියට පැමිණ ඇත්තේ 2008 වසරේදීයි.

මියුසියස් විදුහලේ 3 වසර දක්වා සිංහල මාධ්‍යයෙන්ද 4, 5 වසර දෙක ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද 6 වසර නැවත සිංහල මාධ්‍යයෙන් ද ඉගනුම ලැබූ අසලා 06 වසරේදී සිය මාපියන් සමග ඕස්ට්‍රේලියාවේ පදිංචියට පැමිණියා. ඕස්ට්‍රේලියාවට පැමිණි අසලාට 2012 වසර දක්වා එනම් වසර 4ක්ම සිංහල ඉගැනීමට අවස්ථාවක් ලැබුනේ නැහැ. ඇය පදිංචි වෝනම්බුල් ප්‍රදේශයේ වෙසෙන සිංහල පවුල් සංඛ්‍යාවද ඉතා සීමිතයි. මෙවන් පරිසරයක වෙසෙන අසලා එක් වසරක විධිමත් සිංහල අධ්‍යාපනයකින් පසුව මෙවන් උසස් ප්‍රතිඵලයක් ලබාගැනීම බෙහෙවින්ම අගය කළ යුතු තත්වයක්. ඇගේ මේ ජයග්‍රහනයට ඇගේ මාපියන් දෙපලගේ මෙන්ම ඇගේ පන්ති භාර විපුලි ගුණසේකර මහත්මියගේ කැපවීමද මහගු අත්වැලක් වූ බව සඳහන් කල යුතුමයි.

සිංහල භාෂාව ඉගෙනීමෙන් වසර 4ක් දුරස් වීමෙන් අනතුරුව එක් වසරක කාලයක් තුල තම සිංහල දැනුම දියුණු කරගත්තේ කෙසේද යන්න මා අසලාගෙන් විමසූවිට ඇගේ පිළිතුර වූයේ සතිපතා සිංහල පුවත්පත (ලක්බිම) ලබාගෙන කියවීමත් කාලසටහනට අනුව සිංහල විෂයයට කාලයක් වෙන් කරගෙන පාඩම් කටයුතු කිරීමත් ඇගේ දැණුම දියුණු කර ගැනීමට මහත් සේ ඉවහල් වූ බවයි. ඇය නිවසේදී කතා කලේ සිංහල භාෂාවෙන්. සිංහල භාෂාව හැදෑරීම සඳහා ඇයට සිය පාසලෙන් සතියකට පැය 5ක කාලයක් ලබා දී තිබුණා. ඒ කාලය ඇය තම සිංහල දැනුම දියුණු කර ගැනීම සඳහා යෙදවූවා. විභාගයට සූදානම් වීමේදී 2002 වසරේ සිට පසුගිය විභාග ප්‍රශ්ණ පත්‍ර අධ්‍යනය කල ඇය තොරතුරු සොයා ගැනීම සඳහා අන්තර්ජාලය යොදා ගත්තා. සිංහල ගුරුතුමිය පැවැත්වූ අතිරේක පන්ති සියල්ලටම ඇය සහභාගි වුනා. වී.සී.ඊ. විභාගයේ වාචික පරීක්ෂණය සඳහා ඇය තෝරාගත්තේ කලාව හා රසවින්දනයි යන මාතෘකාව යටතේ වත්මන් සංගීතයි යන මාතෘකාවයි. ඇය සිංහල පාසැලේ 11 වසරේ සිස සිසුවියන් සඳහා මගපෙන්වන්නියක් (mentor) වශයෙන් ද කටයුතු කලා. ඇගේ සිංහල ගුරුතුමිය ඇයව හැඳින්වූයේ කලට වේලාවට වැඩ කරන ඉදිරිපත් වීමේ හැකියාව ඇති, ධෛර්යමත් ශිෂ්‍යාවක් ලෙසටයි.



දරුවන්ගේ උසස් අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවක් ඉගෙනීමේ වටිනාකම දෙමාපියන් අවබෝධ කර ගැනීම ඉතා වැදගත්. වී.සී.ඊ. විභාගයට පෙනී සිටින දරු දැරියනට උසස් පාඨමාලා සඳහා ඇතුලත් වීමට ඉහල "ඕසෘ අගයක් ලබා ගැනීම අවශ්‍ය වනවා. යම් සිසුවකු විෂයයක් සඳහා ලබා ගන්නා ලකුණු ප්‍රමාණය (raw marks) විශ්ව විද්‍යාලයට ඇතුලත් කර ගැනීමේ අවශ්‍යතාවය සඳහා ප්‍රමිතිකරණයට (scaled up or down) ලක් කෙරෙනවා. එසේ කිරීමෙන් පසුව ලැබෙන ප්‍රමුත ලකුන තමයි ATAR අගය ගණනය කිරීම සඳහා යොදා ගන්නේ. ඒ ඒ විෂය ප්‍රමිතිකරණයට යොදාගන්නා ලකුණු සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ සෑම වසරකම ඒ ඒ විෂයයන් ලබා ගන්නා සාපේක්ෂ ප්‍රගතිය අනුවයි. එනම් සිසුන් එම විෂය හැදෑරීම සඳහා කෙතරම් උත්සාහයක් ගනු ලැබ තිබීද යන්න මෙහිදී සැලකිල්ලට ගනු ලබනවා.

ඉංග්‍රීසි නොවන වෙනත් භාෂා අධ්‍යාපනය :ඛධඹෘ* දියුණු කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව වෙනත් භාෂා අධ්‍යයනය සඳහා අමතර ලකුණු (bonus marks) 05ක් ලබා දීමට රජය තීරණයක් ගෙන තිබෙනවා. ඒ අනුව වී.සී.ඊ. විභාගය සඳහා සිංහල විභාගයට පෙනී සිටින සිසුන්ට එම අමතර ලකුණු ලබා ගැනීමේ වාසිය හිමි වනවා. එක් එක් වසරේ දී මෙසේ එකතු වන අමතර ලකුණු ප්‍රමාණය වෙනස් වෙනවා. 2012 වසරේදී සිංහල භාෂාව සඳහා අතිරේක ලකුණු 07 ක් ලබා දී තිබෙනවා. 2011 වසරේදී සිංහල භාෂාව සඳහා අතිරේක ලකුණු 09ක් ලැබී තිබුණා. මේ අනුව සිංහල පරිසරයක හැදී වැඩෙන අපේ දරුවන්ට වී.සී.ඊ.විභාගය සඳහා සිංහල භාෂාව ඉගෙන ගැනීමෙන් වෙනත් විෂයයක් ඉගෙනීම සඳහා වැය කරන කාලයට වඩා අඩු කාලයක් යෙදවීමෙන් ඉහල ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමේ ඉඩකඩක් තිබෙනවා.

වික්ටෝරියානු භාෂා පාසලේ දැනට මධ්‍යස්ථාන 05 ක සිංහල භාෂාව ඉගැන්වීම කෙරෙනවා. මෙල්බර්න් හි උතුරු ප්‍රදේශයේ රොක්ස්බර්ග් පාක් හා මිල්පාක් යන පාසල්වල වී.සී.ඊ. දක්වා සිංහල ඉගෙනීමට අවශ්‍ය පහසුකම් තිබෙනවා. කුඩා දරුවන් මූලික (prep) මට්ටමේ දීම සිංහල පාසලට ඇතුලත් කරගත හැකියි. සෙනසුරාදා දිනවල පෙ.ව. 9.00 සිට 12.20 දක්වා පන්ති පැවැත්වෙනවා.

මේ වසරේ සිට Bright හා Horsham යන ප්‍රදේශ වල වෙසෙන සිංහල සිසුන්ට රොක්ස්බර්ග් පාක් මධ්‍යස්ථානය සමග video conferencing මගින් සම්බන්ධ වී සිංහල ඉගැනීමට අවස්ථාව ලබා දීම වික්ටෝරියානු භාෂා පාසලේ තවත් එක් කඩඉමක් බව සඳහන් කල යුතුයි. දුර බැහැර ප්‍රදේශවල සිටින සිංහල දරුවන් වැඩි සංඛ්‍යාවක් සිංහල ඉගෙනීමට උනන්දුවක් දක්වන්නේ නම් එය විධිමත් දුරස්ථ අධ්‍යාපන මට්ටම දක්වා දියුණු කිරීමටද දැන් අවස්ථාව උදාවී තිබෙන බව රොක්ස්බර්ග් පාක් සිංහල භාෂා පාසලේ සමාරම්භක ගුරුතුමියක් මෙන්ම එහි සම්බන්ධීකරන නිළධාරිණිය වශයෙන් විශිෂ්ට සේවාවක් ඉටු කරන හිමාලි කරුණාසේන මහත්මිය සඳහන් කලා.

විදෙස් රටක විසුවද තම හෙල බසට ආදරය කරමින් ඒ වෙනුවෙන් බොහෝ සේ කැපවීම් කොට එහි ඵල නෙලාගත් අසලා දියණියගේ ඉදිරි ගමනට ඇය ලැබූ මේ ජයග්‍රහණය ආලෝකයක්ම වේවා.

# සුභාෂිතයෙන්



| | |
|---|---|
| නොපනත් අය අනත අහසෙව් නැත | නියම |
| එමහත් බැවින් වනසනු නොයෙදේ | සැවොම |
| තමසිත් තුලෙහි වෙර නැසුවොත් | නොතබාම |
| වැනසෙත් ඔහු සැවොම දියැවන් ගිනි | සේම |

**ගැදි කවිය:**




නොපනත් අය
අනත අහසෙව්
නියම නැත
ඒ මහත් බැවින්
සැවොම වනසනු
නොයෙදේ.
තම සිත් තුලෙහි
වෙර
නොතබා ම නැසුවොත්
ඔහු සැවොම
දියැවන් ගිනි සේම
වැනසෙත්.

**තේරුම:** දුර්ජනයෝ හෙවත් කිසි දු කමකට නැති අවය අනන්ත වූ ආකාශය වගේ කොපමණ සිටිද්දැ ය් කිව නොහැකි තරමට සිටිති. එහෙයින් ඔවින් සියල්ලන් වැනසීම" දුරු කිරීම නොකල හැකි ය; නොකල යුතු ය. තම තමන් ගේ සිත්වල ඇති වය්රය මුලුමනින් ම නැති කර ගත් විට ඒ දුර්ජනයන් හැම දෙනා ම දියෙහි වැටුනු ගිනි (අඟුරු හෝ පුපුරු) මෙන් විනාශ වී යනු ඇත.

**විස්තර:** බන කතාවල ඔය වගේ කොතෙකුත් අවවාද උපහැරන ඇතත් ප්‍රායෝගික වශයෙන් අපට ඒ අනුව ක්‍රියා කල නො හැකිය.

අවි අමෝරා ගෙන වහසි බස් දොඩමින් ඉදිරියට එන සතුරාට වුවත් මෛත්‍රී කල යුතු බව බන කතාවල සඳහන් වී ඇත. ඒ අනුයන්නන් මෝඩයන් නොහොත් බියගුල්ලන් ලෙස තවත් කෙනෙකුට පෙනෙන්නට බැරි නැත. රූමත්කම නිසා විපතට පත් ගෑනු කොතරම් සිටිද්ද ? දනවත් කම නිසා විපතට පත් පෝසත්තු කොතරම් සිටිද්ද ?

සැම/හැම යනු නිපාද පදයකි. එය හැමා - හැමෝ - හැමන් - හැමට ආදී වශයෙන් වර නැඟිය නොහැකිය. එහෙත් සමහරු හැමෝම - හැමෝටම - හැමෝගෙන් ම ආදී වශයෙන් "හැම" වරනඟා ලියති.

මේ කවියේ දෙපලකම ලියා ඇති 'සැවොම' යනු "සැම" යන පදය ඇසුරින් හදා ගත් එකකි. එය නිපාත පදයක් බව කිවි ගජ බින්න කල එකසර කෙසර යුර මේ කිවිඳුන්ට ද අමතක වී ඇත.

වියරන රීති කැඩීමත් පද විකෘති කිරීමත් තමන් අතින් සිදු වීම වරදක් නොවෙතිය් සමහර කිවින්දෝ සිතති.

"ගජකුම් බිඳින එකසර කෙසරිඳු බලැති
කොතරම් සා වුවත් තනකබල නුබුදිති" ය්

මේ කිවින්දා කියුවේ ඒ නිසා ය. ඔහු 'කෙසරිඳු' යන ඒක වචන උක්තයට "නුබුදිති" යන බහු වචන ආඛ්‍යාතය යෙදුවේ ඒ නිසා ය. ගැදියේ දී මෙන්ම පැදියේ දීත් බස් දොස්, බස් දොස් ම වේ.

අපෙ අම්මා කොලඹ ගිහිල්ලා...... මට අලුතෙන් පොත් ගෙනැවිල්ලා......... ගුත්තලයේ කවි මට කට පාඩම්..........
අමාවතුර මට වතුර වගේ.

මේ ගීතය ගයන්නේ අවු. 10 - 12 ක ලමයකු විය යුතුය. ඔහුට ගුත්තිලයේ කවි කීපයක් කට පාඩම් වීම අරුමයක් නොවේ. අමාවතුර මට වතුර වගේ යන්නෙන් අදහස් කරන්නේ වේගයෙන් නොවරද්දා කියවිය හැකි වීම විය යුතු ය. මා "අමාවතුර" යන නම ඇසුවේ වයස අවුරුදු 15 ඉකුත් වූ පසු ය. ඒ පොත කියවූයේ අවුරුදු 25 ඉකුත් වූ පසු ය. අතිශයෝක්තියත් අලංකාරයක් නොවැ !